


කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අන්තර්ජාල පුවත් පත   වෙළුම 03 - කලාපය 06   2016 ජූනි   පිටු 05 යි

ඇතුල් පිටු :


අම්පාර හෙළ බොජුන්හල ලගදීම පාරිභෝගික සේවයට----03

වී වගාවේ ඒකාබද්ධ පළිබෝධ පාලනය පිළිබඳ පුහුණු වැඩසටහනක්-----------------------03

ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහනට තරුණ ගොවි සමාජ දායක කරගැනීමට පියවර-----------------------------04

ස්ථිර බෝග සායන පුහුණු වැඩසටහනක් කිලිනොච්චියේදී--05

මහනුවර කිංස්වුඩ් විදුහල සැබෑ ශ්‍රී ලාංකේය රසට රැගෙන යයි--05

ශාක ආරක්ෂණ පනත යටතේ පත්කළ බලයලත් නිලධාරීන් හට පුහුණුවක්----------------------05



කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
තැ. පෙ. 01,
පරණ ගලහ පාර, පේරාදෙණිය.
දුරකථන අංක : 081 2388331/2/4
වෙබ් අඩවිය : www.doa.gov.lk

ඔබගේ අදහස් හා යෝජනා අපවෙත එවන්න
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (සන්නිවේදන),
තැ.පෙ. 24,
කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය,
ගන්නෝරුව.
දුරකථන අංකය : 081 205 8282

agripress.doa@gmail.com
Agriculture Publication Unit


# ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනේ ප්‍රගතිය සොයා බැලීමට

## කෘෂිකර්ම අමාත්‍යවරයා නුවරඑළිය බණ්ඩාරවෙල සංචාරයක



2016 - 2018 ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනේ ප්‍රගතිය හා බීජ අර්තාපල් නිෂ්පාදනයෙහිලා ගොවි දායකත්වය සොයා බැලීමට ගරු කෘෂිකර්ම අමාත්‍ය දුමින්ද දිසානායක මැතිතුමා පසුගිය ජූනි 30, ජූලි මස 01, 02 යන තෙදින නුවරඑළිය බණ්ඩාරවෙල සංචාරයක නිරත විය. මෙහිදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සීතාඑළිය කෘෂිකර්ම පර්යේෂණ ආයතනය අමාත්‍යවරයා විසින් නිරීක්ෂණයට ලක් කරන ලදි. මෙය නුවරඑළිය හෙළ බොජුන් හල විවෘත කිරීමෙන් අනතුරුව සිදුකරන ලදි. මෙම පර්යේෂණ ආයතනයේ පර්යේෂණ ප්‍රගතිය, නවතම පර්යේෂණයන් පිළිබඳව තොරතුරු මෙහිදි අවධානයට ලක්විය. බීජ අර්තාපල් හිඟය වර්ථමානයේ අර්තාපල් වගාකරුවන් මුහුණ දෙන ප්‍රධානතම ගැටළුවයි. "ජී0" බීජ නිෂ්පාදනය මෙම ගැටළුව සඳහා කාලීන පිළියම ලෙස හඳුනාගෙන ඇත. මෙම "ජී0" බීජ නිෂ්පාදනය මුල් කාලයේ සීතා එළිය පර්යේෂණ ආයතනයේ පමණක් සිදුකල අතර මෑතකදී වගාකරුවන්ද ඒ සඳහා දායක කර ගෙන ඇත. මෙම සංචාරයේදී සීතාඑළිය පර්යේෂණ ආයතනයේ

2 පිටුවට...

1 පිටුවෙන්...

අර්තාපල් "ජී0" නිෂ්පාදනය කෘෂිකර්ම අමාත්‍යවරයාගේ වැඩි අවධානයකට ලක් විය. අනතුරුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සීතාඑළිය ප්‍රදේශයේ ඉදිකරන ලද නව එළවළු ඇසුරුම් මධ්‍යස්ථානයද, කාෂිකර්ම අමාත්‍යවරයා විසින් විවෘත කරන ලදි.



මෙරට එළවළු නිෂ්පාදනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් පසු අස්වනු හානියට ලක්වන අතර වගාකරුවන් නිසි පසුඅස්වනු ක්‍රමවේද භාවිතා නොකිරීම මීට ප්‍රධානතම හේතුව වී ඇත. මෙයට පිළියම් ලෙස එළවළු වගා කරන ප්‍රදේශ ආශ්‍රිතව එළවළු ඇසුරුම් මධ්‍යස්ථාන ඇති කර වගාකරුවන්ට තම නිෂ්පාදන නිසි පරිදි ඇසුරුම් කර වෙළඳපොලට ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසීමයි. මෙම විවෘත කරන ලද එළවළු ඇසුරුම් මධ්‍යස්ථානයෙන් එම ප්‍රදේශයේ නිෂ්පාදනය කරන එළවළු නිසි පරිදි ඇසුරුම් කර වෙළඳපොල වෙත ඉදිරිපත් කිරීමට පහසුකම් සලසා ඇත. අනතුරුව කඳපොල බීජ අර්තාපල් ගොවිපල ද අමාත්‍යවරයාගේ නිරීක්ෂණයට ලක් විය. ඉන්පසුව බණ්ඩාරවෙල කහගොල්ල ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයේ නව දෙමහල් රසායනාගාර හා පරිපාලන ගොඩනැගිල්ල ද කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් විවෘත කරන ලදි.



කහගොල්ල ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයේ ඉදිකළ නව රසායනාගාර හා පරිපාලන ගොඩනැගිල්ල

ප්‍රගතිය, නවතම පර්යේෂණ පිළිබඳව තොරතුරු සොයාබලන ලදි. රහංගල කෘෂිකර්ම පර්යේෂණ ආයතනය හා බීජ ගොවිපලද ඇමතිවරයාගේ නිරීක්ෂණයට ලක්විය. මෙම සංචාරය අතරතුර අමාත්‍යවරයා ප්‍රදේශයේ අර්තාපල් වගාකරුවන් මුණ ගැසී අර්තාපල් වගාවල් සම්බන්ධව ඔවුන් මුහුණ දෙන ගැටළු පිළිබඳව සාකච්ඡා කරන ලදි. ඒ වගේම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ වෘතීන් වල වෘතිය සමිති හා සාකච්ඡාවක් පවත්වා ඇත. මධ්‍යම පළාත් කෘෂිකර්ම අමාත්‍ය එම්. රාමේෂ්වරන් මහතා, ඌව පළාත් කෘෂිකර්ම අමාත්‍ය උපාලි සමරවීර මහතා, කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් බී. විජයරත්න මහතා, කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය රොහාන් විජේකෝන් මහතා, සීතාඑළිය කෘෂිකර්ම පර්යේෂණ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඒ. පී. සී. බාබු මහතා, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු පිරිසක් මෙම අවස්ථාවන්ට සහභාගි වී ඇත.






## අම්පාර හෙළ බොජුන්හල ලඟදීම පාරිභෝගික සේවයට

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති ඒකකය විසින් අම්පාරේ ඉදිකරන ලද හෙළ බොජුන්හල මේ මස අවසානයේදී ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් විසින් පාරිභෝගික ජනතාවට විවෘත කිරීමට නියමිත බව එම ඒකකය සඳහන් කරයි. කෘෂිකර්ම අධ්‍යක්‍ෂ ජනරාල් ආචාර්ය රොහාන් විජේකෝන් මහතාගේ සංකල්පයකට අනුව මෙරට ආහාර රටාවෙන් ඉවත්ව යන සැබෑ ශ්‍රී ලාංකේය රසය යලිත් ජනතාව වෙත ලබා දීමේ අරමුණින් දිවයින පුරා හෙළ බොජුන්හල් ඇති කිරීමේ වැඩසටහන යටතේ මෙම හෙළ බොජුන්හල ඉදි කර ඇත. අවිධිමත් ආහාර වලින් තොර දේශිය ආහාර වලට පමණක් මුල් තැන දෙමින් ජනතාව වෙත පෝෂ්‍යදායී ආහාර වර්ග සහන මිලට ලබා දීමට මෙමඟින් පියවර ගැනේ. ප්‍රදේශයේ සුළු පරිමාණ කාන්තා ව්‍යවසායකයන් සඳහා දිරිදීමක්ද මෙමගින් අපෙක්ෂා කෙරේ.

මධුමාලි සුබුද්ධිකා - කෘෂිකර්ම උපදේශක

## වී වගාවේ ඒකාබද්ධ පළිබෝධ පාලනය පිලිබඳ පුහුණු වැඩසටහනක්



කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පැළෑටි සංරක්ෂණ සේවය විසින් වී වගාවේ ඒකාබද්ධ පළිබෝධ පාලනය සම්බන්ධව සංවිධානය කරන ලද පුහුණු වැඩසටහනක් අනුරාධපුර ඉපලෝගම ප්‍රදේශයේදී පසුගිය ජුනි මස 27 දින පවත්වන ලදි. වී වගාවේ පළිබෝධ පාලනය සඳහා භාවිතා වන කෘෂිරසායන ද්‍රව්‍ය අවම කර ඒකාබද්ධ ක්‍රම භාවිතා කර පළිබෝධීන් මර්ධනය වර්තමානයේ කෘෂි රසායන ද්‍රව්‍ය නිසා උද්ගතව ඇති සෞඛ්‍ය හා පාරිසරික ගැටළු අවම කර ගැනීමට පිළියමක් වේ. එම නිසා වගාකරුවන් අතර පළිබෝධ පාලනයට භාවිත වන ඒකාබද්ධ ක්‍රම වේදයන් ප්‍රචලිත කිරීමේ අරමුණින් මෙවැනි පුහුණු වැඩසටහන් නිරන්තරයෙන් සංවිධානය කරනු ලබයි.

නිර්මලා හපුකොටුව - සංවර්ධන නිලධාරි



# “මෙරට සෑම ප්‍රධාන නගරයකම හෙළ බොජුන්හල් ඇති කරනවා”

## කෘෂිකර්ම අමාත්‍යවරයා නුවරඑළිය හෙළ බොජුන්හල විවෘත කරමින් කියයි



කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති ඒකකය මෙහෙය වීමෙන් නුවරඑළියේ ඉදිකරන ලද සැබෑ ශ්‍රී ලාංකේය රසය රැගත් හෙළ බොජුන් හල පසුගිය ජුනි මස 30 වැනි දින කෘෂිකර්ම අමාත්‍ය ගරු දුමින්ද දිසානායක මැතිතුමන් විසින් පාරිභෝගික ජනතාව වෙනුවෙන් විවෘත කරන ලදි. වස විස වලින් තොර ආහාර ජනතාවට පරිභෝජනය කිරීමට සැලැස්වීම කාලීන අවශ්‍යතාවයක් බවත් මෙරට සෑම ප්‍රධාන නගරයකම මෙවැනි හෙළ බොජුන්හල් ආරම්භ කිරීමට පියවර ගන්නා බවත් මෙම උත්සව අවස්ථාව අමතමින් කෘෂිකර්ම අමාත්‍යවරයා ප්‍රකාශ කරන ලදී. වර්තමානයේ ජනතාව පෙර නොවූවිරූ ලෙස බෝනොවන රෝග රැසකට ගොදුරුවෙමින් පවතින අතර ජනතාව තුළ ඇති අවිධිමත් ආහාර පරිභෝජනය ඊට ප්‍රධාන හේතුවක් ලෙස විද්වතුන් පෙන්වා දෙයි. දේශීය ආහාර පරිභෝජනය ඉහළ නැංවීම එම රෝග තත්ත්වයන්ගෙන් ආරක්ෂා වීමට එක් පියවරක් බව ද ඔවුන් පෙන්වා දී ඇත. එම අරමුණ පෙරදැරිව මෙවැනි හෙළ බොජුන් හල් රට පුරා ඇතිකිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. පළාත් කෘෂිකර්ම අමාත්‍ය එම්. රාමේෂ්වරන් මහතා, නුවරඑළිය නගරාධිපති මහින්ද දොඩම්පේගමගේ මහතා, කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් බී. විජයරත්න මහතා, කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය රොහාන් විජේකෝන් මහතා ඇතුළු විශාල පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

සුබුද්ධිකා මධුමාලි - කෘෂිකර්ම උපදේශක

## ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහනට තරුණ ගොවි සමාජ දායක කරගැනීමට පියවර

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් දිවයින පුරා ආරම්භකර ඇති තරුණ ගොවි සමාජ සාමාජික සමාජිකයන් 2016 - 2018 තුළ ක්‍රියාත්මක වන ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහනට දායක කර ගැනීමට මේ වන විට කටයුතු ආරම්භකර ඇති බව තරුණ ගොවි සමාජ මූලස්ථානය සඳහන් කරයි. මේ සඳහා දැනුවත් කිරීමේ සැසිවාර කිහිපයක් පසුගිය ජූනි මාසය පුරාවට පවත්වා ඇත. ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ මිරිස් වගාව ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් මෙම සැසිවාර පවත්වා ඇත. ජූනි මස 6 දින අනුරාධපුර, 9 දින මාතර, 22/ 23 දින වල කිලිනොච්චිය, 29/ 30 දිනවල වවුනියාව යන දිස්ත්‍රික්කවල පිහිටුවා ඇති තරුණ ගොවි සමාජ වෙනුවෙන් මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.

ආර්. ඒ. පී. කේ. රන්දෙණිය - කෘෂිකර්ම උපදේශක



කාලීන කෘෂි සංවාද සඳහා පිවිසෙන්න . . . .
www.goviya.lk වෙබ් අඩවියට






කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිළිබඳ තොරතුරු, නවතම කෘෂි නිපැයුම්, කෘෂි තාක්ෂණය, ප්‍රකාශන සහ නවතම වැඩසටහන් පිළිබඳ දැනගැනීමට පිවිසෙන්න www.doa.gov.lk කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියට

## මහනුවර කිංස්වුඩ් විදුහලට සැබෑ ශ්‍රී ලාංකේය රසය රැගෙන යයි



පාසල් සිසුන් අතරේ දේශිය ආහාර ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පාසල් තුළ හෙළ බොජුන් හල් ආරම්භ කිරීමේ වැඩසටහන යටතේ මහනුවර කිංස්වුඩ් විදුහලේ ආරම්භ කරන ලද හෙළ බොජුන් හල පසු ගිය ජුනි මස 11 දින විවෘත කර ලදි. දරුවන් කුඩා කල සිටම දේශිය ආහාර පරිභෝජනයට යොමු කිරීමෙන් සාමාජය තුළ වේගයෙන් පැතිර යන බෝ නොවන රෝග වලින් සමාජය රැක ගැනිමින් නිරෝගිමත් පරපුරක් බිහි කිරීම මෙම වැඩසටහනේ අරමුණ වී ඇත. පාසල් වල ඇති සාම්ප්‍රදායක ආපන ශාලා වෙනුවට හෙළ බොජුන් හල් ස්ථාපිත කිරිම වර්තමානයේ වඩා හොඳ ප්‍රවණතාවයක් බවට පත් වී ඇත.

මධුමාලි සුබුද්ධිකා - කෘෂිකර්ම උපදේශක

## ස්ථිර බෝග සායන පුහුණු වැඩසටහනක් කිලිනොච්චියේදී



ගන්නෝරුව පැළෑටි සංරක්ෂණ සේවය හා අන්තර් ජාතික CABI ආයතනය එක්ව කෘෂිකර්ම උපදේශකවරුන් ශාක වෛද්‍යවරුන් බවට පත්කිරීමේ වැඩසටහන යටතේ තවත් පුහුණු වැඩසටහනක් පසුගිය ජුනි මස 1, 2, 3 යන තෙදින තුළ කිලිනොච්චිය වඩ්ඩකච්චි පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වා ඇත. උතුරු පළාතේ කෘෂිකර්ම උපදේශකවරුන් දාහත් දෙනෙකු සඳහා මොඩියුල 1 යටතේ මෙම පුහුණු වැඩසටහන පවත්වා ඇත.

නිර්මලා හපුකොටුව - සංවර්ධන නිලධාරි

## ශාක ආරක්ෂණ පනත යටතේ පත් කල බලයලත් නිළධාරීන් හට පුහුණුවක්



දිවයින පුරා විසිරි ඇති ශාක ආරක්ෂණ පනත යටතේ පත් කළ බලය ලත් නිළධාරින් සඳහා සංවිධානය කරන ලද විශේෂ දෙදින පුහුණු වැඩසටහනක් පසු ගිය ජුනි මස 30 හා ජුලි මස 01දින ගන්නෝරුව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේදි පවත්වන ලදි. ගන්නෝරුව පැළෑටි සංරක්ෂණ සේවය විසින් සංවිධානය කරන ලද මෙම පුහුණු වැඩසටහනට නිලධාරින් 40 ක පමණ පිරිසක් සහභාගි වී අත.

නිර්මලා හපුකොටුව - සංවර්ධන නිලධාරි

